# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1656/24 - 2010 ජුනි 02 වැනි බදාදා - 2010.06.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

### අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

මහින්ද රාජපක්ෂ

ශ්‍රී ලංකාවේ මහජන හදිසි අවස්ථා තත්ත්වයක් පැවතීම හේතුකොට ගෙන මහජන ආරක්ෂාව සහ රටේ යථා පැවැත්ම සුරක්ෂිත කිරීම හා මහජන ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යෑම සඳහා මෙසේ කිරීම අවස්ථානුකූල යයි මා අදහස් කරන හෙයින්,

ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, 1959 අංක 8 දරන පනතින් සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 6 දරන පනතින් සහ 1988 අංක 28 දරන පනතින් සංශෝධිත (40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඒ ආඥාපනතේ II වැනි කොටසේ විධිවිධාන ශ්‍රී ලංකාව මුළුල්ලේ ම දෙදහස් දහයක් වූ ජුනි මස 02 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතු යයි මේ ප්‍රකාශනයෙන් ප්‍රකාශ කරමි.

වර්ෂ දෙදහස් දහයක් වූ ජුනි මස 02 වැනි දින කොළඹ දී අත්සන් කරන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ලලිත් වීරතුංග,
ජනාධිපති ලේකම්.

06-382

1A - G 12927 — 880 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.